# ඉතිහාසයේ රජ කථා

## 2 කොටස



චිරංජීවා මහේෂ්වරී අබේසිංහ

# ඉතිහාසයේ රජ කථා

## 2 කොටස

චිරංජීවා මහේෂ්වරී අබේසිංහ

මහමායා බාලිකා විද්‍යාලය / මහනුවර

11/01/2026

පළමු මුද්‍රණය - 2026

ISBN : 978-624-208-925-6

සියලුම හිමිකම් ඇවිරිණි.

Chiranjeewa Maheshwari Abeysinghe ® text copyright ©

Illustration copyright ©Layout copyright ©

All rights reserved. No part of this work may be reproduced or utilized in any form or by any means, electronic or mechanical, including photocopying, recording, or by any information storage and retrieval system, without the prior written permission of the author.

Hiranyaabeysinghe73@gmail.com

පිටකවරය - අන්තර්ජාලයෙන් නොමිලයේ ලබාගත්

ඡායාරූප යොදාගෙන නිර්මාණය කර ඇත.

ව්‍යාපෘතිය යටතේ රචනා කළ මෙම නිර්මාණය. E - ග්‍රන්ථයක් ලෙස 2026

මහමායා බාලිකා විදුහල මඟින් අන්තර්ජාලයට මුදාහරින ලදී.

This book was published as an E-book, on 2026 by Mahamaya Girls' College, Kandy, Sri Lanka.

Catalogue record for this book is available from The National Library and Documentation Services Board, Sri Lanka

**books by Chiranjeewa Maheshwari Abeysinghe**

Tenuli meets the Tooth Fairy

Eat the Veggies or Meet the Devil

Tenuli, Her sister, & The Fairy Godfather

I AM HAPPY !

**ධම්මෝ හවේ රක්ඛති, ධම්ම චාරී ( 03 -04 -05 කොටස )**

**ධම්මෝ හවේ රක්ඛති, ධම්ම චාරී combined**

# පිදුම

**අපගේ ආදරණීය මෑණියන්ට**

**සෙනෙහෙබර පියාණන්ට**

**අපගේ ආදරණීය සොහොයුරියට**

**සෙනෙහෙබර අත්තම්මා සහ අත්තාට**

**අපගේ සියලුම ගුරුමෑණිවරුන් සහ ගුරුපියවරුන්ට**

# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා  සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

## සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිමර්ාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතරල එය පොත්පත් හා සාහිත්‍ය නිමර්ාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා නිමර්ාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොවල සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්මල මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාථර්ක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමියල ගුරු මණ්ඩලයල සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිවර්ාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාථර්කත්වයක් ලබනු ඇතැයි ප්‍රාථර්නා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචායර් , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

## සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලයල ශිෂ්‍ය දියණිවරුන්ල සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්ල අනිවාර්යල ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාවල විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැලල
දියවඩන නිලමේල
ශ්‍රී දළදා මාලිගාව
2026-05-10

# ඉතිහාසයේ රජ කථා

# 2 කොටස

1505 මාර්තු මාසයේ දී පෘතුගාලයේ රජු, පෙරදිග පෘතුගීසි ප්‍රතිරාජ්‍යා වශයෙන් ෆ්‍රැන්සිස්කු ද අල්මේදා පත් කර එවන ලදී. ඔහුගේ පුත් ලොරෙන්සෝද අල්මේදා ගමන් ගත් නැව් කණ්ඩායම් කුණාටුවකට හසු වී අහඹු ලෙස මෙරටට ගොඩබාන ලදි.

vi පරාක්‍රමබාහු රජු රට එක්සේසත් කර තිබුණ ද ඔහුගේ මරණින් පසු, පෘතුගීසීන් පැමිණෙන කාලයේ දී රටේ එක්සත්කම බිඳ වැටී තිබුණි. මෙකල කෝට්ටේ රාජධානියට අමතරව, යාපනයේ රාජධානියත්, උඩරට රාජධානියත් පැවතුණි. මුලින් ම පෘතුගීසීන් කෝට්ටේ රාජධානිය සමග සම්බන්ධකම් පැවැත්විය.

1521 දී ඇති වූ විජයබා කොල්ලයත් සමග කෝට්ටේ රාජධානිය කොටස් 3 කට බෙදී ගියේය.

කෝට්ටේ viii වන වීර පරාක්‍රමබාහු රජුගෙන් පසුව vi වන විජයබාහු රජු රජවිය. විජයබාහු රජුගේ පළමු විවාහයේ පුතුන් වූ බුවනෙක බාහු, මායාදුන්නේ, රයිගම් බණ්ඩාර යන තිදෙනාට රජකම් නොදී දේවරාජ නම් වෙනත් කුමරෙකුට රජකම දීමට තීරණය විය.

ඉහත කුමාරවරු තිදෙනා උඩරට රජ වී සිටි ජයවීර බණ්ඩාර රජුගෙන් උදව් ගෙන කෝට්ටේ ට පැමිණ රාජ්‍ය බලය ලබා ගැනීමට තැත් කළේ ය. සලමාන් නැමැත්තා vi වන විජයබාහු රජු මරා දැමීය. vi වන විජයබාහු රජුගෙන් බලය ලබා ගැනීමට 1521 දී ඇති වූ මෙම සිද්ධිය විජයබා කොල්ලය නම් වේ.

විජයබා කොල්ලයෙන් පසුව කෝට්ටේ රාජ්‍ය කොටස් 03 කට බෙදුණි.

01. කෝට්ටේ - vii වන බුවනෙකබාහු රජු
02. සීතාවක - මායාදුන්නේ රජු
03. රයිගම - රයිගම බණ්ඩාර රජු

කෝට්ටේ vii වන බුවනෙකබාහු රජු හා සීතාවක මායාදුන්නේ රජු අතර කෝට්ටේ රාජ්‍යය සම්බන්ධයෙන් මතභේද ඇති විය.

vii වන බුවනෙකබාහු රජුට පුතුන් නොසිටියේ ය. ඔහුට සමුද්‍රදේවිය නම් දියණියක් විය. ඇය විවාහ කරගෙන සිටියේ රණශූර වීදිය බණ්ඩාරයි. ඔවුන්ට

ධර්මපාල සහ විජයපාල ලෙෂ පුතුන් දෙදෙනෙකු විය. vii වන බුවනෙකබාහු රජු ධර්මපාල කුමරුට කෝට්ටේ පාලනය භාර දීමට තැත් කළේ ය. මායාදුන්නේ ගෙන් එල්ලවන තර්ජන නිසා vii වන බුවනෙකබාහු රජු පෘතුගීසීන්ගෙන් ආරක්ෂාව ඉල්ලා ඔවුන් කෝට්ටේ අගනුවරට ගෙන්වා ගත්තේ ය. පෘතුගීසීන් හා මුස්ලිම්වරුන් අතර වෙළෙඳ තරගයක් පැවතිණ. පෘතුගීසීන් කෝට්ටේ රාජ්‍යය තුළ සිටි මුස්ලිම්වරුන්ට එරෙහිව කටයුතු කළහ. vii වන බුවනෙකබාහු රජු ද එම මුස්ලිම්වරුන්ට විරුද්ධව ක්‍රියාකිරීමට පෙළඹ විය.

වෙරළබඩ ප්‍රදේශවල මුස්ලිම්වරුන්ගේ සහය මායාදුන්නේ රජුට ලැබුණි. උඩරට රජු වූ ජයවීර බණ්ඩාර රජුගෙන් ද මායාදුන්නේ රජුට සහය ලැබුණි.

මුහුදුබඩ ප්‍රදේශවල සිටි මුස්ලිම්වරුන්ගේ ඉල්ලීම මත ඉන්දියාවේ කැලිකට්වල පාලකයා වූ සැමොරින්, මායාදුන්නේ රජුට නාවික සහය ලබා දුනි. එම සහය මත මායාදුන්නේ රජු පෘතුගීසීන්ට විරුද්ධව සටන් කළ ද පෘතුගීසීන්ගේ නාවික බලය සහ අවිබලය නිසා පෘතුගීසීන්ට එරෙහි සටන් සාර්ථක නොවිණි.

සීතාවක හා කෝට්ටේ අතර ඇති වූ සටන්වල දී කෝට්ටේ රාජධානියෙ ආරක්ෂාවට පෘතුගීසීන් සටන් කළහ. vii වන බුවනෙකබාහු රජු පෘතුගීසීන්ට යුධ වියදම් දැරීය. vii වන බුවනෙකබාහු රජු පසුව පෘතුගීසීන්ට එරෙහිව කටයුතු කළ නිසා 1550 දෙසැම්බර් 29 වන දින වෙඩිතබා vii වන බුවනෙකබාහු රජුව ඝාතනය කරන ලදී.

vii වන බුවනෙකබාහු රජු ජීවත් ව සිටිය දී තම මුනුපුරු ධර්මපාල කුමරුගේ පිළිරුවක් පෘතුගාලයට යවා එහි දී ඔටුනු පැළඳවිය. එමනිසා පෘතුගීසීන්ගේ ආරක්ෂාව ධර්මපාල කුමරුට ලැබුණි.

vii වන බුවනෙකබාහු රජුගේ මරණින් පසු ධර්මපාල කුමරු කෝට්ටේ රජවිය. ධර්මපාල කුමරු,

- පෘතුගීසීන්ගේ රූකඩ පාලකයෙක් විය.
- ඔහු කතෝලික ආගම වැළඳ ගන්නා ලදි.
- කතෝලික ආගම කෝට්ටේ රාජධානිය තුළ පැතිර වීම.
- කෝට්ටේ වැසියන්ට පෘතුගීසීන්ගෙන් වන අකටයුතුකම් වැළකීමට ක්‍රියා නොකිරීම නිසා

ධර්මපාල රජුට මහජන සහය නොලැබුණි.

1551 සිට 1597 දක්වා ධර්මපාල රජු නාමික රජ කෙනෙකු ලෙස සිටියේ ය. ධර්මපාල රජු තෑගි ඔප්පුවකින් තම කෝට්ටේ රාජධානිය පෘතුගීසීන්ට පැවරිය.

ධර්මපාල රජුගේ පියා වීදිය බණ්ඩාර පෘතුගීසීන්ට විරුද්ධව සටන් කළේ ය. ඔහු අල්ලා කොළඹ කොටුව තුළ සිරකරන ලදි. සමුද්‍රා දේවිය කොටුව තුළට

උමගක් කප්පවා වීදිය බණ්ඩාර නිදහස් කරගන්නා ලදි. වීදිය බණ්ඩාර පස් යොදුන් කෝරළයට පැනගොස් පැළෑද ප්‍රදේශයේ බලකොටුවක් සාදා පෘතුගීසීන්ට විරුද්ධව සටන් මෙහෙයවිය.

වීදිය බණ්ඩාරට කෝට්ටේ ජනයාගේ සහය ලැබුණි. වීදිය බණ්ඩාරගේ සටන් පෘතුගීසීන්ටත්, සීතාවක රාජ්‍යයටත් මහත් හිරිහැරයක් විය. එමනිසා මායාදුන්නේ රජ, පෘතුගීසීන් සමග එකතු වී වීදිය බණ්ඩාර පරාජය කළේ ය. ඔහු උඩරට පලා ගියේ ය. අනතුරුව යාපනයට ද පලා ගියේ ය. එහි ඇති වූ සටනකින් ඔහු මිය ගියේය.

සීතාවක මායාදුන්නේ රජු කෝට්ටේ පාලකයන් සහ පෘතුගීසීන් යන දෙකොටස ම එරෙහිව සටන් කළේය.

1555 වන විට මායාදුන්නේ රජුගේ පුත් රණශූර ටිකිරි බණ්ඩාර කුමරු සීතාවක හමුදාවට නායකත්වය දුන්නේය.

1557 කෝට්ටේ නගරයට ප්‍රබල ප්‍රහාරයක් එල්ල කළත් පෘතුගීසි කාලතුවක්කු ප්‍රහාර නිසා ප්‍රහාරය ව්‍යාර්ථ විය.

සීතාවක පාලකයෝ කෝටටේ හා කොළඹ කොටුවට එකවර පහර දීමේ සටනක් දියත් කළහ. ටිකිරි බණ්ඩාර කුමරු මෙහෙය වූ සීතාවක හමුදාවත් පෘතුගීසීනුත් අතර මුල්ලේරියා වෙලේදී දරුණු සටන් ඇති විය. පෘතුගීසීන් 1600 පමණ මිය ගියහ.

සීතාවකින් කෝට්ටේ නගරයට වරින් වර එල්ල වූ සටන් නිසා 1565 දී ධර්මපාල රජු කොළඹ කොටුවට පදිංචියට ගියේය.

1581 දී මායාදුන්නේ රජු මිය ගියේ ය. ටිකිරි බණ්ඩාර කුමරු රාජසිංහ රජු ලෙස සීතාවක රජ විය. සීතාවක රාජසිංහ රජු උඩරට රාජධානියේ පාලකයා වූ කරල්ලියද්දේ බණ්ඩාර පලවා හැර උඩරට රාජධානිය සීතාවකට ඈඳා ගත්තේය. පෘතුගීසීන් කොළඹ කොටුවට සහ ප්‍රදේශ කීපයකට සීමා විය.

කෝට්ටේ රාජධානියට අයත් බොහෝ ප්‍රදේශ ද, උඩරට රාජධානිය ද, රයිගම රාජධානියට මුළුමනින් ම සීතාවකට යටත් විය.

සීතාවක රාජසිංහ රජු අවස්ථා 02 ක දී පෘතුගීසීන් කොළඹ කොටුවෙන් පලවා හැරීමට උත්සාහ කළත්, පෙරදිග පෘතුගීසි මූලස්ථානය වූ ගෝවෙන් පෘතුගීසීන්ට ආධාර ලැබීමත්, පෘතුගීසීන් සතු අවි ආයුධ බලය නිසාත් එම උත්සාහයත් අසාර්ථක විය. සීතාවක රාජධානියට නාවික ශක්තියක් ද නොවීය.

සීතාවක රාජසිංහ රජු උඩරට විමලධර්මසූරිය රජු හා කළ සටනින් පැරදී සීතාවකට යන අතර පෙතංගොඩ උයනේදී උණ ගසක කටුවක් ඇනී ඇති වූ තුවාලයෙන් මරණයට පත්විය.

- සීතාවක පාලකයන් නිරන්තුරු සටන්වල යෙදීමත්
- රාජසිංහ රජු අවසන් කාලයේ බෞද්ධ විරෝධී ප්‍රතිපත්තියක සිටීමත්
- රාජසිංහ රජුට උඩරට යටත් කර දීමට උදවු වූ වීරසුන්දර බණ්ඩාර මැරවීමත්
- වීරසුන්දර බණ්ඩාරගේ පුත් කොනප්පු බණ්ඩාර උඩරට රජවීමත්
- රාජසිංහ රජුගෙන් පසු සීතාවක රාජධානියට නිසි උරුමකරුවෙකු නොසිටීමත්
- උඩරට වැසියන්ගේ සහාය අඩුවීමත් නිසා සීතාවක රාජධානිය බිඳ වැටුණි.

නැවත ශක්තිමත් වූ පෘතුගීසීන් කෝට්ටේ රාජධානියත්, රයිගම රාජධානියත්, සීතාවක යටතේ තිබූ ප්‍රදේශත් අත්පත් කරගෙන මෙරට මුහුදුබඩ ප්‍රදේශ රැසක බලය පිහිටුවිය.

# යාපන රාජධානිය

රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසු යාපන රාජධානිය බිහි විය. එහි පාලකයන් ආර්ය චක්‍රවර්තී නම් පෙළපතක අය වූහ.

ලංකාවට පෘතුගීසීන් ආ කාලයේ යාපනය පාලනය කළේ පරරාජසේකරම් රජු ය. 1519 දී සංකිලි නම් කුමාරයෙක් යාපනයේ බලය අල්ලාගෙන 1561 දක්වා එම රාජධානිය පාලනය කළේ ය.

පෘතුගීසි වෙළෙඳ නැව්වලට බාධා කිරීමත්, යාපනයේ කතෝලික ආගම පැතිර වීමට විරුද්ධව රජු ක්‍රියා කිරීමත් නිසා 1543 දී පෘතුගීසීන් යාපනය ආක්‍රමණය කළහ. සංකිලි රජු පෘතුගීසීන් ඉල්ලූ කප්පම් ලබා දී ගැටුම වැළකිය.

සංකිලි රජු බලයෙන් පහ කරන ලෙස මිෂනාරී පූජකවරු පෘතුගීසීන්ගෙන් ඉල්ලීය.

1548 දී සංකිලි රජු සීතාවක, මායාදුන්නේ රජු සමඟ සන්ධානගත විය. පෘතුගීසී විරෝධී වීදිය බණ්ඩාරට රැකවරණය ද දුනි.

1560 පෘතුගීසීන් යාපනය ආක්‍රමණය කළහ. සංකිලි රජු අගනුවරින් පලා ගියේ ය. පෘතුගීසීන්ගේ දැඩි කොන්දේසිවලට යටත් ව සංකිලි රජුට රාජ්‍ය

බලය ලැබුණි. නමුත් මන්නාරම අල්ලාගත් පෘතුගීසීන් මන්නාරම බලකොටුව සෑදූහ. මන්නාරම අවට මුතු කිමිදීමෙන් ලද ආදායම රජුට නැතිවිය. පෘතුගීසීන් මන්නාරමේ සිට යාපනයේ පාලනයට ඇඟිලි ගැසූහ. 1561 දී සංකිලි රජු බලයෙන් පහ කර පුවිරාජපණ්ඩරම් කුමරා රජ විය.

සිංහාසනයට උරුමකරුවන් අතර බල අරගල ඇතිවිය. ඔවුන් වරින් වර පෘතුගීසීන්ගේ උදව් පැතීය. 1591 දී පෘතුගීසීන් යාපනය ආක්‍රමණය කර එදිරිමාන සිංහම් නම් තැනැත්තා රජකරවිය. 1617 දී යාපනයේ පාලකයා මියගිය නිසා බල අරගලය නැවත ඇති විය.

- යාපනයේ රජු උඩරට රජුට යාපනයේ මුහුදු සීමාව හරහා දකුණු ඉන්දියාව සමග වෙළෙඳ සම්බන්ධතා පැවැත්වීමට ඉඩ දීම නිසා, 1619 දී පිලිප් ද ඔලිවේරා හමුදාවක් ගෙන විත් යාපනය යටත් කර ගන්නා ලදි.

පෘතුගීසීන් සමග සිට ඔවුන්ගේ යුද්ධ ශිල්පය, උපාය මාර්ග අවබෝධ කර ගෙන සිට කොනප්පු බණ්ඩාර, විමලධර්ම සූරිය නමින් රජවීම පෘතුගීසීන් නොඉවසීය.

1594 දී පෘතුගීසි කපිතාන් ජනරාල් පෙරෝ ලොපෙස් ද සුසා ආක්‍රමණයක් දියත් කර තම රැකවරණය ලබමින් සිටි කරලියැද්දේ බණ්ඩාරගේ දියණිය කුසුමාසන දේවිය (දෝන කතිරිනා) උඩරටට කැඳවා ගෙන ගොස් ඇයව උඩරට රැජින ලෙස පත් කළහ.

උඩරැටියෝ i වන විමලධර්මසූරිය රජුට සහය දුන්හ. පෘතුගීසීහු පසු බැස්හ. 1594 දී දන්තුරේ වෙලේ දී පෘතුගීසි හමුදාව උඩරැටියන් සමග විශාල සටහන් කළහ. මේ සටනින් පෙරෝලොපෙස් ද සුසා ඇතුළු සියලු ම පෘතුගීසීන් හමුදාව විනාශ විය.

i වන විමලධර්මසූරිය රජතුමා කුසුමාසන දේවිය විවාහ කරගන්නා ලදී. පේරෝ ලොපේස් ද සුසාගේ මරණින් පසු දොන් ජොරෙනිමො ද අසවේදු මෙරට පෘතුගීසි කපිතාන් විය.

මේ අතර පහතරට ප්‍රදේශවල එදිරිල්ලේ රාල යටතේ කැරැල්ලක් ඇතිවිය. i වන විමලධර්මසූරිය රජු ඔහුට සහය දැක්විය. පෘතුගීසි කැරලි නායකයින් මරා ගම්බිම් ගිනි තැබූහ.

1602 දොන් ජොරෙනිමොද අසවේදු ගෝවෙන්ද හමුදා ගෙන්වා ගෙන උඩරට ආක්‍රමණය කළේ ය. බලන කපොල්ලේ දී උඩරැටියන් පෘතුගීසි හමුදාව වටකර දරුණු ප්‍රහාරයක් එල්ල කළහ. අසවේදු පරාජ වී මල්වාන හරහා කොළඹට පසු බැස්සේ ය.

පෘතුගීසින් විශාල ආක්‍රමණ සිදු නොකර වරින් වර ගම්බිම්වලට පහර දෙමින් උඩරැටියන්ට හානි කළහ.

මේ නිසා i වන විමලධර්මසූරිය රජුගෙන් පසුව රජ වූ සෙනරත් රජු 1617 දී පෘතුගීසීන් සමඟ සාම ගිවිසුමකට එළඹිය.

1630 ජූලි මාසයේ පෘතුගීසි භටයන් 600 ක් පමණ ද 4500 ක් පමණ වන කුලී හමුදාවක් ද ගෙන පෘතුගීසි කපිතාන් ජනරාල් කොන්ස්තන්තීනු ද සා බදුල්ල නගරය අල්ලා ගෙන එය විනාශ කළේ ය. උඩරට හමුදාවට නායකත්වය දෙමින් සෙනරත් රජුගේ පුත් මහා අස්ථාන කුමරු බදුල්ලට පැමිණ පෘතුගීසීන් සමඟ සටන් කළේ ය. පෘතුගීසීන් වැල්ලවාය අසල රන්දෙනිවලට පසු බැස්සහ. එහි දී පෘතුගීසීන් වටකර උඩරැටියන් ප්‍රහාර එල්ල කළහ. කපිතාන් ජනරාල් කොන්ස්තන්තිනු ද සා ඇතුළු 350 ක් පමණ පෘතුගීසි හමුදාව මරණයට පත් විය.

1638 මාර්තු පෘතුගීසි කපිතාන් ජෙනරාල් දියෝගෝද මෙලෝ නැවත ආක්‍රමණයක් කළේ ය. ඔවුන් මහනුවර නගරයට ඇතුළු විය. ii වන රාජසිංහ රජු නගරයෙන් ඉවත් විය. ගන්නෝරුවේ දී දෙපක්ෂය අතර දරුණු සටන් ඇතිවිය. පෘතුගීසි හමුදාවත් දියෝගෝ ද මෙලෝන් මිය ගියේ ය.

උඩරට බලය ලබා ගැනීමට පෘතුගීසීන් එල්ල කළ සියලු ආක්‍රමණ සාර්ථක වීමත් උඩරට රාජධානියේ තවදුරටත් ආරක්ෂා වීමත් බලපෑ හේතු,

1. උඩරට ජනතාව සෑම විටම රජුට සහය වීම.
2. පෘතුගීසී සමඟ එකතුව සටනට ගිය පහතරැටියන් උඩරට දී උඩරට රජු ට සහය දීම.
3. උඩරැටියන්ගේ ගරිල්ලා සටන් උපක්‍රම සහ රජවරුන්ගේ උපාය කෞෂලයය
4. උඩරට රාජධානියේ ස්වභාවික පිහිටීම.

ලන්දේසීන්ගේ මවුරට ඕලන්දයයි. පෘතුගීසි ආසියාවට පැමිණ අවුරුදු 100 ක පමණ ගතවන විට පෘතුගීසීන් ආසියාවට එන මුහුදු මාර්ග එළිකර ගැනීමට ලන්දේසීන්ට හැකි විය. මුල දී ඕලන්දයේ තිබූ විවිධ වෙළෙඳ සමාගම් ආසියාවට ආ නිසා එම විවිධ වෙළෙඳ සමාගම් අතර ද වෙළෙඳාමට තරගයක් ඇති විය. එම නිසා පෙරදිග ශක්තිමත් බලයක් ලන්දේසීන්ට නොලැබුණි. 1602 ලන්දේසි වෙළෙඳ සමාගම් කීපයක් එකතු කර VOC සමාගම (පෙරදිග ඕලන්ද වෙළෙඳ සමාගම) පිහිටුවන ලදි.

ආසියාවට පැමිණි ලන්දේසීහු ජාවා දූපතේ බතාවිය මූලස්ථානය කරගෙන පෙරදිග බලය පතුරුවා හැරීය. 1602 ලන්දේසී දූතයෙකු වූ ජොරිස් වෑන් ස්පිල්බර්ජන් ලංකාවට පැමිණ i වන විමලධර්මසූරිය රජු හමුවිය. ඊටපසු සිබල් ද වර්ට් නම් දූතයා පැමිණියේ ය.

ලන්දේසීන් හා උඩරට පාලකයින් අතර, ඵලදායී සම්බන්ධතා ආරම්භ වූයේ ii වන රාජසිංහ රජුගේ කාලයේ දී ය. ii වන රාජසිංහ රජුට අවශ්‍ය නාවික බලය සඳහා ලන්දේසීන්ගේ සහය අපේක්ෂා කළේ ය.

ලන්දේසී නාවික හමුදා අණදෙන නිලධාරීන් වෙස්ටර්වර්ල්ඩ් ලංකා දූතයන් අතර ඇති වූ එකඟතාව මත 1638 දී ලන්දේසීන් හා ලාංකිකයන් එකතු වී මඩකලපුවේ පෘතුගීසි බලකොටුවට පහර දුනි. බලකොටුවේ සිටි පෘතුගීසීන් යටත් විය. 1638 දී ii වන රාජසිංහ රජු ලන්දේසීන් සමඟ ගිවිසුමක් අත්සන් කළේ ය.

එහි මූලික කරුණු,

1. පෘතුගීසීන් මෙරටින් පලවා හැරීමට උඩරට රජුට සහය දීම.
2. ලන්දේසීන්ට වැය වන මුදල් වෙළෙඳ ද්‍රව්‍ය මගින් ගෙවීම.
3. ඇතුන් හැර උඩරට සෙසු වෙළෙඳ ද්‍රව්‍ය ලබා ගැනීමෙන් ඒකාධිකාරී අයිතිය ලන්දේසීන්ට දීම.
4. පෘතුගීසීන්ගෙන් අල්ලාගත් බලකොටුවල රජුගේ අභිමතයට අනුව ලන්දේසි හමුදාව සිටුවීම.

පෘතුගීසීන් සතුව තිබූ ත්‍රිකුණාමලය, මීගමුව, ගාල්ල, කළුතර, කොළඹ, මන්නාරම හා යාපනය බලකොටු උඩරට හමුදාව සහ ලන්දේසි අල්ලා ගන්නා ලදි. 1658 දී පෘතුගීසීන් සම්පූර්ණයෙන්ම ලංකාවෙන් නෙරපන ලදී. ලන්දේසීන් විවිධ හේතු දක්වමින් තමන්ට වාසිවන බලකොටු උඩරට රජුට භාර නොදුන්හ.

1665 - 1668 කාලයේ ලන්දේසීහු ප්‍රහාර මාලාවක් දියත් කර උඩරටට අයත් ප්‍රදේශ කීපයක් අත්පත් කරගත්හ.

1670 - 1675 කාලයේ ii වන රාජසිංහ රජු එල්ල කළ ප්‍රහාර නිසා ලන්දේසීන්ට අයත් ප්‍රදේශ රැසක් නැවත ලබා ගැනීමට හැකි විය.

1670 සිට අවුරුදු 100 ක් පමණ ම ලන්දේසීන් උඩරැටියන් සටන් නොකළහ. 1764 දී ලන්දේසි බැරන් වෑන් එක් ආණ්ඩුකාරවරයාගේ මෙහෙය වීම මත සේනාංක 06 ක් යොදා ගනිමින් උඩරට ආක්‍රමණය කළහ. නමුත් මහනුවරට ඇතුළු වීමට නොහැකි විය.

1765 දී නැවත වරක් උඩරට ආක්‍රමණය කර මහනුවරට ඇතුළු විය. නමුත් ආහාර හිඟය, ලෙඩ රෝග, වැසි සමය නිසා මහනුවර අතහැර කොළඹට ගියහ.

1766 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජු ලන්දේසී සමඟ සාම ගිවිසුමක් අත්සන් කළේ ය. එයින් වැඩි වාසිය ලන්දේසීන් ට හිමිවිය.

# මහනුවර රාජධානිය

vi වන පරාක්‍රමබාහු රජු කෝට්ටේ පාලනය කරන කාලයේ මහනුවර ප්‍රදේශය කෝට්ටේ රාජ්‍යයට යටත් පාලන ඒකකයකි. ඒ කල මහනුවර ප්‍රදේශය පාලනය කළේ ජෝතිය සිටුවරයා ය. ජෝතිය සිටුවරයා උඩරට, කෝට්ටේ රාජ්‍යයෙන් නිදහස් කර ගැනීමට vi වන පරාක්‍රමබාහු රජුට විරුද්ධව කැරැල්ලක් ඇති කළේ ය. එම කැරැල්ල අසාර්ථක විය. vi වන පරාක්‍රමබාහු රජු මිය ගිය පසු කෝට්ටේ රාජ්‍ය දුර්වල විය.

සේනාසම්මත වික්‍රමබාහු ප්‍රභූවරයා උඩරට ප්‍රදේශය කෝට්ටේ පාලනයෙන් නිදහස් කරගෙන උඩරට රාජධානිය පිහිටුවේ ය. සෙංකඩගල නගරය ප්‍රධාන නගරය විය.

සේනා සම්මත වික්‍රමබාහු රජතුමාගේ පුතා ජයවීර බණ්ඩාරයි. ජයවීර බණ්ඩාර රජුගේ කාලයේ කෝට්ටේ රාජධානිය කෝට්ටේ, සීතාවක, රයිගම ලෙස කොටස් තුනකට බෙදුණි.

16 වන සියවස ආරම්භයේ පෘතුග්‍රීසීහු ලංකාවට ආහ. ඔවුන් කෝට්ටේ රාජධානිය සමඟ සම්බන්ධතා ඇති කර ගත්හ.

ජයවීර බණ්ඩාර රජුගෙන් පසු ඔහුගේ පුත් කරල්ලියද්දේ බණ්ඩාර උඩරට රාජධානියේ පාලකයා විය.

සීතාවක පාලකයෝ කරල්ලියද්දේ බණ්ඩාර උඩරට රාජධානියේ රජුවීම ගැන අසතුටු වූහ. සීතාවකින් එල්ල වූ තර්ජන නිසා කරල්ලියද්දේ බණ්ඩාර රජතුමා පෘතුගීසීන් සමඟ හිතවත් විය. මේ හිතවත්කම් නිසා රජු කෙරෙහි උඩරට ප්‍රභූවරු කලකිරුණහ.

උඩරට ප්‍රභූවරයෙකු වූ වීරසුන්දර බණ්ඩාර, සීතාවක පාලකයා වූ i වන රාජසිංහ රජුට උඩරට අත්පත් කර ගැනීමට උදව් කළේ ය. කරල්ලියද්දේ බණ්ඩාර රජතුමා තම දියණියන් බෑනාත් සමඟ මන්නාරමට පලා ගොස් පෘතුගීසි රැකවරණය ලැබූහ. රජුගේ දියණිය කුසුමාසන දේවිය, දෝන කතිරිනා ලෙසත් රජුගේ බෑනා වූ යමසිංහ බණ්ඩාර, දොන් පිලිප් ලෙසත් භෞතීස්ම වූහ.

ක්‍රි.ව. 1580 දී i වන රාජසිංහ රජතුමා උඩරට රාජධානිය යටත් කරගත්තේය. ඔහු සීතාවක සිට උඩරට රාජධානිය පාලනය කළේය.

i වන රාජසිංහ රජතුමා සහ වීරසුන්දර බණ්ඩාර අතර මතභේද ඇතිවිය. රජතුමා වීරසුන්දර බණ්ඩාර මැරවීය.

වීරසුන්දර බණ්ඩාර ප්‍රභූවරයාගේ පුතා කොනප්පු බණ්ඩාර පෘතුගීසීන් වෙත ගොස්, දොන් ජුවන් ලෙස හෞතීස්ම ලැබීය.

## i වන විමලධර්ම සූරිය රජතුමා (ක්‍රි.ව. 1592 - ක්‍රි.ව. 1604)

සීතාවක රාජසිංහ රජතුමා ශිව ආගම වැළඳ ගත්තෙකි. ඔහු සීතාවක සිට උඩරට පාලනය කරන කාලයේ බෞද්ධ භික්ෂූන්ට එරෙහිව ක්‍රියා කළේ ය. උඩරට ප්‍රභූහු සීතාවක රාජසිංහ රජු කෙරෙහි කලකිරුණහ.

පෘතුගීසීන් යමසිංහ බණ්ඩාර උඩරටට යවා රජකරවීය. යමසිංහ බණ්ඩාර රජුගේ ආරක්ෂාවට කොනප්පු බණ්ඩාර ද උඩරටට යවන ලදී. යමසිංහ බණ්ඩාර රජු මිය ගියේය. පෘතුගීසීන් යමසිංහ බණ්ඩාර රජුගේ ලාබාල පුත් කුමරු රජකර රූකඩ පාලනයක් ගෙනයෑමට උත්සාහ කළහ. කොනප්පු බණ්ඩාර පෘතුගීසීන්ට එරෙහිව යමින් ක්‍රි.ව. 1592 දී, i වන විමලධර්මසූරිය නමින් උඩරට රජවීය. එහෙත් ඔහුට එවකට සිංහාසනයට නීත්‍යානුකූල උරුමයක් නොතිබුණි. එමනිසා එතුමා කුසුමාසන දේවිය (දෝන කතිරිනා කුමරිය) විවාහ කරගෙන නීත්‍යානුකූල උරුමය තහවුරු කර ගත්තේ ය.

i වන රාජසිංහ රජු (සීතාවක රාජසිංහ) උඩරට ආක්‍රමණය කළ අවස්ථාවේ i වන විමලධර්මසූරිය රජතුමා ඔහුව පරාජය කළේ ය. එමගින් සීතාවක බලපෑමෙන් උඩරට නිදහස් කර ගත්තේ ය.

ක්‍රි.ව. 1590 දී දන්තුරේ සටනේ දී සහ ක්‍රි.ව. 1602 දී බලන සටනේ දී i වන විමලධර්මසූරිය රජු, පෘතුගීසීන් පැරදවිය.

එතුමා බුදුදහම නඟා සිටුවීමට කටයුතු කළේය. බුරුම රටෙන් උපසම්පදාව ගෙන එන ලදී. ලංකාතිලකය, ගඩලාදෙණිය වැනි විහාර අලුත්වැඩියා කරන ලදී.

දෙල්ගමුව විහාරයේ කුරහන් ගලක් තුළ සඟවා තිබූ දළදා වහන්සේ උඩරට රාජධානියට වැඩමවන ලදි.

## සෙනරත් රජතුමා (ක්‍රි.ව. 1604 - 1635)

i වන විමලධර්මසූරිය රජුගේ ඥාති සහෝදරයෙකි. ඔහු සාමකාමීය. 1617 දී පෘතුගීසීන් සමඟ සාම ගිවිසුමක් අත්සන් කළේ ය. නමුත් පෘතුගීසි කපිතාන්

ජනරාල් කොන්ස්තන්තිනෝ ද ශා විශාල සේනාවක් ගෙන ඌව ආක්‍රමණය කළේ ය. සෙනරත් රජුගේ පුත් මහා ආස්ථාන කුමරු හමුදාව මෙහෙයවා රන්දෙනිවෙල දී පෘතුගීසීන් පරාජයට පත් කළේ ය.

## ii වන රාජසිංහ රජතුමා (ක්‍රි.ව. 1635 - 1687)

සෙනරත් රජුගෙන් පසු මහා අස්ථාන කුමරු ii වන රාජසිංහ නමින් රජවිය. මෙතුමා 1638 දී දියෝගු ද මේලෝ නම් පෘතුගීසි කපිතාන් ජනරාල්වරයා සහ හමුදාව, ගන්නෝරු වෙළේදී අන්ත පරාජයට පත්කරන ලදී.

1638 දී මෙතුමා ලන්දේසීන් සමඟ ගිවිසුමක් අත්සන් කළේ ය. ඒ අනුව ලන්දේසීන්ගේ උදව්වෙන් 1658 දී පෘතුගීසීන් ලංකාවෙන් නෙරපා දමන ලදී.

පෘතුගීසීන් යටතේ තිබූ ප්‍රදේශ රැසක් උඩරටට එකතු කර ගන්නා ලදී. නමුත් පෘතුගීසීන්ගෙන් අත්පත් කරගත් සමහර ප්‍රදේශ ලන්දේසීන් තමන් යටතේම තබා ගන්නා ලදී.

මෙතුමා උඩරට රාජධානියේ දීර්ඝ කාලයක් පාලන කටයුතු කළේ ය.

## ii වන විමලධර්මසූරිය රජතුමා (ක්‍රි.ව. 1687 - 1707)

ii වන රාජසිංහ රජුගේ පුත්‍රයාය. ඉතා සාමකාමී රජ කෙනෙකි. පහතරට සිටි ලන්දේසීන් සමඟ සුහදව කල් ගෙවීය.

බුරුම රටෙන් උපසම්පදාව ගෙනවිත් උඩරට රාජ්‍යයේ උපසම්පදාව පිහිටුවන ලදි. දළදා මාළිගාව ප්‍රතිසංස්කරණය කරන ලදී.

## ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා (ක්‍රි.ව. 1707 - 1739)

ii වන විමලධර්මසූරිය රජුගේ පුත්‍රයා ය. දුර්වල පාලකයෙකු ලෙස සැලකේ. සිංහල වංශයේ අවසාන රජුය. මෙතුමා නායක්කාර් වංශික ඉන්දියානු කුමරියක් විවාහ කර ගෙන සිටියේය. ඔවුන්ට පුතෙකු නොවීය. එමනිසා නායක්කර් වංශික කුමරියගේ සොහොයුරෝ උඩරට බලයට ආහ.

## ශ්‍රී විජය රාජසිංහ රජතුමා (ක්‍රි.ව. 1739 - 1747)

ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ බිසවගේ සොහොයුරාය. මෙම රජු සරණංකර සඟරාජ හිමියන්ගේ බුද්ධ ශාසනික කටයුතුවලට උදව් කළේ ය.

## කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා (ක්‍රි.ව. 1747 - 1782)

ශ්‍රී විජය රාජසිංහ රජුගේ අග බිසවගේ වයස 16 ක් වූ සහෝදරයා ය. සරණංකර සඟරාජ හිමිගෙන් බණ දහම් හදාරා ඇත. උඩරට වැසියෝ රජතුමාට ගෞරව කළහ.

උඩරට මහා බෞද්ධ පුනරුදයක් ඇති විය. මේ වන විට ලංකාවේ බුද්ධ ශාසනය පිරිහී තිබුණු යුගයක් බැවින් උපසම්පදා භික්ෂූන් සිටියේ අතලොස්සකි.

සරණංකර සඟරාජ හිමියන්ගේ උපදෙස් ගෙන රජතුමා ලන්දේසීන්ගේ නැව් ලබාගෙන සියමට දූතයන් යවන ලදී. උපාලි හිමි ඇතුළු භික්ෂූන් වහන්සේලා මෙරටට වැඩමකරවා ගෙන 1753 දී උපසම්පදා උත්සවයක් පවත්වන ලදී. වැලිවිට සරණංකර හිමියන් සංඝරාජ පදවියට පත් කරන ලදී.

උඩරට හා පහතරට තිබූ වෙහෙරවිහාර විශාල ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කරන ලදී.
උදා :- දඹුලු විහාරය.
මෙතුමා හින්දු භක්තිකයෙකි. නමුත් වාර්ෂික දළදා පෙරහැර පැවැත්වීමට උපකාර දුන් අතර දළදා පෙරහැරට දේවාල පෙරහැර එක් කරන ලදී.

මුහුදුබඩ ප්‍රදේශවල සිටි ලන්දේසීන්ගෙන් උඩරට රාජධානියට නිරන්තර තර්ජන එල්ල විය. ලන්දේසීන්ට විරුද්ධව රජු ඉන්දියාවේ සිටි ඉංග්‍රීසීන්ගෙන් උදව් ලබා ගැනීමට තැත් කළේය. මේ බව දැනගෙන ලන්දේසීන් දිගින් දිගටම උඩරට රාජධානියට ආක්‍රමණ එල්ල කළහ.

1766 දී රජු ලන්දේසීන් සමඟ ගිවිසුමක් අත්සන් කළේ ය.

## රාජාධි රාජසිංහ රජතුමා (ක්‍රි.ව. 1782 - 1798)

කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ සොහොයුරාය. ඔහු භක්තිමත් බෞද්ධයෙකි. මෙකල ඉංග්‍රීසීන්, ලන්දේසීන් නෙරපා, ලන්දේසීන් සතු ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ අත්පත් කොට ගත්හ.

# ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා (ක්‍රි.ව. 1798 - 1815)

රාජාධි රාජසිංහ රජුගෙන් පසු රජකමට උරුම කී නායක්කාර් කුමරුවරුන් දෙදෙනෙක් සිටියහ. ඔවුන් කන්නසාමි හා මුත්තුසාමිය. උඩරට මහඅධිකාරම් පිළිමතලව්වේගේ සහාය කන්නසාමි කුමරුට ලැබුණි. ඔහු 1798 දී ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් උඩරට රජකමට පත්විය.

මුත්තුසාමි කුමරු ආරක්ෂාව පතා ඉංග්‍රීසීන් වෙත ගියේය. රජු මුල දී පිළිමතලව්වේ අධිකාරම්ගේ උපදෙස් පිළිගත්තත් පසුව නායක්කාර ඥාතීන්ගේ උපදෙස් පිළිගන්නා ලදී. මේ වන විට මුහුදු බඩ ප්‍රදේශවල බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා සර් ෆ්‍රෙඩ්රික් නෝර්ත් විය.

1803 දී සර් ෆ්‍රෙඩ්රික් නෝර්ත් උඩරට අල්ලා ගැනීමේ ආක්‍රමණයක් දියත් කළේය. උඩරට වැසියන්ගේ සහාය රජුට ලැබුණු නිසා ආක්‍රමණය අසාර්ථක විය. මුත්තුසාමි කුමරා ජීවිතක්ෂයට පත්විය.

ශ්‍රී වික්‍රමරාජසිංහ රජතුමා දළදා මාළිගාවට ආකර්ෂණීය පත්තිරුප්පුවක් එක් කළේය. මාළිගාව ඉදිරිපස කිරිමුහුද නම් වැව තැනවීය. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාගේ කාලයේ උඩරට රාජධානියේ දේශපාලන අර්බුදයක් ඇතිවිය. රජු සහ රදල ප්‍රභූ පන්තියත්, රජු සහ පොදු ජනතාවත් අතර පැවති සම්බන්ධතා බිඳ වැටිණි.

රජු හා උඩරට මහාධිකාරම් ඇහැලේපොල අතර ගැටුමක් විය. ඇහැලේපොල ආරක්ෂාව පතා ඉංග්‍රීසීන්ට එකතු විය.

එවකට මෙරට ඉංග්‍රීසි ආණ්ඩුකාරයා වූ රොබට් බ්‍රවුන්රිග් උඩරට ආක්‍රමණය කළහ. උඩරටට ඉංග්‍රීසීන්ගේ පැමිණීම වැළැක්වීමට කිසිවෙක් ඉදිරිපත් නොවූහ. එමනිසා ඉංග්‍රීසීන් කිසිදු අපහසුතාවකින් තොරව උඩරටට ඇතුළු වූහ.
ඒ වන විට මැදමහනුවර ප්‍රදේශයේ නිවසක සැඟ වී සිටි ශ්‍රී වික්‍රමරාජසිංහ රජතුමා උඩරට වැසියන් විසින් සොයාගෙන ඉංග්‍රීසීන්ට භාර දෙන ලදී. රජු අත්අඩංගුවට ගැනීම නිසා විශාල ජයක් ඉංග්‍රීසීන්ට හිමි විය.

බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා උඩරට ප්‍රභූවරුන් සමඟ 1815 මාර්තු 02 දින උඩරට ගිවිසුම අත්සන් කළේ ය.

උඩරට රාජධානිය ඉංග්‍රීසීන්ට යටත් බව පිළිගෙන ශ්‍රී වික්‍රමරාජසිංහ රජු ඇතුළු නායක්කර්වරුන්ට උඩරට සිංහාසනයට තිබූ සියලු උරුම අහෝසි කෙරිණි. මෙමගින් සමස්ත දිවයිනම බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක් විය. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා, ඉන්දියාවේ වෙල්ලෝරයට රැගෙන යන ලදී.

16 වන සියවසේ දී පෘතුගීසීන් ආසියාවෙන් කුළු බඩු රැගෙන ගියහ. එම කුළුබඩු සහ වෙළෙඳ ද්‍රව්‍ය, පෘතුගාලයේ ලිස්බන් වරායේ දී ලන්දේසීන් විසින් මිලදී ගත්හ. ලන්දේසීන් එම ද්‍රව්‍ය යුරෝපා රටවලට විකිණූහ. ලන්දේසීන්ගේ රට වූ ඕලන්දය එකල ස්පාඤ්ඤයේ යටත් රටකි.

ස්පාඤ්ඤවරු රෝමානු කතෝලික වූහ. ලන්දේසිහු රෙපරමාදු වූහ. ආගමිකව ද ස්පාඤ්ඤවරු සහ ලන්දේසීන් අතර මත ගැටුම් විය. එම නිසා ලන්දේසීන්, ස්පාඤ්ඤවරුන්ට එරෙහිව නිදහස් සටනක් ඇරඹීය.

ස්පාඤ්ඤයේ ii වන පිලිප් රජු රාජ්‍ය උරුමයක් අනුව පෘතුගාලයේ ද රජ විය. ලන්දේසීන් ලිස්බන් වරායට පැමිණීම ii වන පිලිප් රජතුමා වැළැක්විය. එම නිසා ලන්දේසීන්ට කුළු බඩු හා වෙළෙඳ ද්‍රව්‍ය ලබා ගැනීමට ආසියාවටම පැමිණීමට සිදුවිය.

පෘතුගීසීන් ආසියාවට පැමිණ අවුරුදු 100 පමණ වනතුරු මුහුදු මාර්ග පිළිබඳ දැනුම රහසේ තබා ගන්නා ලදී.

1595 වන විට ලන්දේසීන් ඔත්තුකරුවන් මගින් මෙම මුහුදු මාර්ග හෙළිකර ගත්හ. ඕලන්දයේ වෙළෙඳ සමාගම් කිහිපයක් ආසියාවට ආ අතර, ඒවා අතර ද වෙළෙඳ ද්‍රව්‍ය ලබා ගැනීමට තරගයක් ඇතිවිය.

එමනිසා ඕලන්ද රජු 1602 දී ලන්දේසි වෙළෙඳ සමාගම් කීපයක් එකතු කර පෙරදිග ඕලන්ද වෙළෙඳ සමාගම VOC පිහිටුවන ලදී.

එම VOC සමාගමට ඕලන්ද රජය වෙනුවෙන් ආසියාවේ වෙළෙඳාම් කිරීමට, ප්‍රදේශ යටත් කිරීමට, බලකොටු ඉදිකිරීමට, ආණ්ඩුකාරවරු පත්කිරීමට සහ අදාළ ප්‍රදේශ පාලනයට අවස්ථාව ලැබුණි. VOC සමාගම ප්‍රබල නැව් කණ්ඩායම් ආසියාවට එවූහ.

VOC සමාගම ජාවා දූපතේ බෙතාවිය හෙවත් බතාවිය තම මූලස්ථානය පිහිට වූහ. ආසියාවේ වෙළෙඳ බලය ගොඩනැගීමට පෘතුගීසීන් සමඟ සටන් වැදීමට සිදුවිය.

1602 වන විට උඩරට රාජධානියේ i වන විමලධර්මසූරිය රජු ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල සිටි පෘතුගීසීන් කෙරෙහි දැඩි අප්‍රසන්නතාවයකට පත් ව සිටියේය.

1602 ජූලි මස ලන්දේසි ජාතික ජොරිස් වෑන් ස්පිල්බර්ජන් ලංකාවේ මඩකලපුවට ගොඩ බැස්සේය. ඔහු උඩරටට ගොස් i වන විමලධර්මසූරිය රජු හමුවිය. පෘතුගීසීන් පන්නා දැමීමට ලන්දේසීන්ගේ සහය ගැනීමට රජු කැමති විය.

මෙයින් මාස 3 කට පසු සිබෙල් ද වර්ට් නැමැත්තා ද රජු හමුවිය. පෘතුගීසීන් පලවා හැරීමට කටයුතු කළ ආකාරය සාකච්ඡා විය. නමුත් සිබෙල් ද වර්ට්, රජුට අගෞරව වන ලෙස කතා කළ නිසා රජුගේ සහ ලන්දේසීන් අතර ඇති වූ ගැටුමෙන් සිබෙල් ද වර්ට් මිය ගියේ ය.

i වන විමලධර්මසූරිය රජුට පසු සේනාරත්න රජතුමා රජවිය. ඔහුගේ කාලය ද ලන්දේසීන් දූත කණ්ඩායම් 02 ක් සමග සාකච්ඡා පැවතිණ.

සෙනරත් රජුගෙන් පසු එතුමාගේ පුත් ii වන රාජසිංහ රජකමට පත්විය. එතුමා බතාවියේ ලන්දේසි නියෝජිතයන් සමග සාකච්ඡා පැවැත්විය.

1638 දී රජුගේ හමුදාව සහ ලන්දේසි හමුදාව එකතුව මඩකලපුව පෘතුගීසි බලකොටුව වටලන ලදි. පෘතුගීසීන් එම බලකොටුවෙන් පන්නා දමන ලදී.

1638 මැයි මාසයේ රජු හා ලන්දේසීන් අතර ගිවිසුමක් අත්සන් කෙරිණි. 1638 සිට තවත් අවුරුදු 20 ක් පෘතුගීසි බලය පැවතුනි. පෘතුගීසීන් යටතේ තිබූ ත්‍රිකුණාමලය, මීගමුව, ගාල්ල, කළුතර, කොළඹ, මන්නාරම හා යාපනය ඇතුළු සෙසු බලකොටු ලන්දේසීන් සහ උඩරට හමුදාව යටත් කර ගත්හ.

ලන්දේසීන් තමන්ට වාසිදායක ප්‍රදේශවල බලකොටු රජුට භාර නොදුන්හ. ත්‍රිකුණාමලය සහ මීගමුව බලකොටු යටත් කිරීමෙන් පසු රජු හා ලන්දේසීන් අතර ගැටුම් ඇති විය.

ජෙරාඩ් හල්ෆ්ට් නම් ලන්දේසි සෙනෙවියා විශාල ලන්දේසි හමුදාවක් මෙරටට ගෙනාවේ ය. ii වන රාජසිංහ රජු ද විශාල හමුදාවක් ලන්දේසීන්ට ලබා දුන්නේ ය. ඔවුන් කොළඹ පෘතුගීසි බලකොටුව යටත් කර ගත්හ.

ගාලු කොටුවේ සිට ක්‍රියාත්මක වූ ලන්දේසී හූ එතැන් පටන් කොළඹ කොටුව තම ප්‍රධාන මූලස්ථානය කරගත්හ. ii වන රාජසිංහ රජු මෙයින් කෝප විය. 1658 දී ලන්දේසීන් මන්නාරම, යාපනය, කල්පිටිය අල්ලා ගත්හ. පෘතුගීසි පාලනය අවසන් විය.

පෘතුගීසීන් යටතේ තිබූ ප්‍රදේශවල බලය ලන්දේසීන් ලබා ගැනීමට තැත් කිරීම නිසා ii වන රාජසිංහ රජු පෘතුගීසීන් යටතේ තිබූ ප්‍රදේශ ගණනාවක් උඩරටට ඈඳා ගත්තේ ය.

ලන්දේසීහු කොළඹ, ගාල්ල, මාතර, මීගමුව, කල්පිටිය, මන්නාරම, යාපනය, ත්‍රිකුණාමලය, මඩකලපුව ආදී ප්‍රදේශවල විශාල බලකොටුවක් ද, අලිමංකඩ, පේදුරුතුඩුව, කයිට්ස් ආදී ස්ථානවල කුඩා බලකොටු ද සාදන ලදී.

1659 - 1668 කාලයේ දී උඩරට යටතේ තිබූ නැගෙනහිර හා බස්නාහිර වෙරළබඩ ප්‍රදේශ කිහිපයක් ලන්දේසීන් අල්ලා ගත්හ.

ii වන රාජසිංහ රජු 1670 සිට ලන්දේසීන්ට විරුද්ධව ශක්තිමත් හා ක්ෂණික ප්‍රහාර එල්ල කළේ ය. 1658 න් පසු ලන්දේසීන් අල්ලා ගත් සියලු ප්‍රදේශ උඩරට රාජධානියට ඈඳා ගන්නා ලදී.

1687 දී ii වන රාජසිංහ රජු මිය ගියේ ය. ඔහුගේ පුත් ii විමලධර්මසූරිය රජතුමා බලයට පත් විය. මෙතුමා ලන්දේසීන් සමඟ මිත්‍රශීලීව කටයුතු කළේ ය.

ii විමලධර්මසූරිය රජුගෙන් පසු ඔහුගේ පුත් කුණ්ඩසාලේ කුමාරයා, ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ ලෙස පත්විය. එම රජතුමා කල්පිටිය, පුත්තලම වැනි වරායවලින් පුවක්, ඇතුන් හා ඇත් දළ ඉන්දියාවට යවමින් වෙළෙඳ කටයුතුවල වැඩි වශයෙන් නියැලුණේ ය. මෙය ලන්දේසීන්ට පාඩුවකි.

ලන්දේසීන් සියලු වරායන් වසා උඩරට වෙළෙඳාමට බාධා ඇති කළේ ය. රජතුමා ද තම ප්‍රදේශ හරහා ඇතුන් ගෙන යාම තහනම් කර, කුරුඳු ඇතුළු කුළු බඩු හා උඩරට ආහාර වර්ග ලන්දේසීන්ට විකිණීම තහනම් කරන ලදී.

ලන්දේසී පාලන ප්‍රදේශවල ජනයා ලන්දේසි ක්‍රියාමාර්ග හා බදු රැස් කිරීමට විරුද්ධව කැරලි ගැසූහ. ලන්දේසීන් එම කැරලි මර්ධනය කළහ.

1739 දී ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු මියගිය අතර, එතුමාට පුතෙකු නොසිටි නිසා එතුමාගේ නායක්කර් වංශික බිරිඳගේ සොහොයුරෙක් ශ්‍රී විජය රාජසිංහ ලෙස රජවිය.

ශ්‍රී විජය රාජසිංහ රජුගෙන් පසු ඔහුගේ බිරිඳගේ නායක්කර් වංශික සොහොයුරා කීර්ති ශ්‍රී රාජසිංහ ලෙස රජවිය.

වැලිවිට සරණංකර හිමිගේ උපදෙස් අනුව රජු ලන්දේසීන්ගේ නැව් ලබාගෙන දූත කණ්ඩායමක් සියම් දේශයට යවන ලදි. උපාලි හිමි ප්‍රමුඛ භික්ෂූන් පිරිසක් මෙහි වැඩම කරවා ගෙන 1733 දී උපසම්පදාව පිහිටුවන ලදි.

1762 වන විට ලන්දේසීන් හා රජු අතර, නැවතත් ගැටුම් ඇති විය. ලන්දේසීන් පලවා හැරීමට රජු ඉංග්‍රීසීන්ගේ සහය පැතී ය. 1762 දී ජෝන් පයිබස් නම් ඉංග්‍රීසි ජාතිකයා රාජ දූතයෙකු ලෙස උඩරටට පැමිණියේ ය.

බියට පත් ලන්දේසීහු උඩරට රාජධානිය අල්ලා ගැනීමට තැත් කළහ. බැරන් වෑන් එක් ආණ්ඩුකාරවරයාගේ මෙහෙය වීමෙන් සේනාංක 6 ක් මාර්ග 6 කින් උඩරටට යැවීය. උඩරැටියන්ගේ ප්‍රහාර හමුවේ සේනාංක පරාජය විය.

1765 දී ද නැවත ආක්‍රමණයක් කළහ. එහි දී දෙපාර්ශවයටම දැඩි හානි සිදුවුවත් ලන්දේසීන් 1765 පෙබරවාරි මස මහනුවරට ඇතුළු වූහ. රජු හඟුරන්කෙතට පලා ගියේය. ලෙඩ රෝග හා උඩරැටියන්ගේ ප්‍රහාරවලින් අසරණ වූ ලන්දේසි හු නැවත උඩරටින් ඉවත් වූහ.

නායක්කර් වංශිකයින්ගේ හැසිරීම් නිසා රදලවරුද බෞද්ධ භික්ෂූන් ද කලකිරීමට පත්වූහ. රජතුමා සාමය වෙනුවෙන් ලන්දේසීන්ට දූතයන් යැවීය. 1766 දී වගන්ති 25 කින් යුත් ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙම ගිවිසුමෙන් පසු උඩරට රාජධානියට පාඩු රැසක් ඇතිවිය. කීර්ති ශ්‍රී රාජසිංහ රජුගෙන් පසුව 1782 දී එතුමාගේ සොහොයුරා රාජාධි රාජසිංහ ලෙස රජවිය.

1796 දී ඉංග්‍රීසීන් ලංකාවට පැමිණ ලන්දේසීන්ට පහර දී ඔවුන් පලවා හැර ඔවුන්ගේ පාලන ප්‍රදේශ අල්ලා ගන්නා ලදි.

ලන්දේසීන්ගෙන් උඩරට රාජධානියට එල්ල වූ හිරිහැර හා තර්ජන හේතුවෙන් ලන්දේසීන් හා උඩරට රජු අතර මතභේද උද්ගත විය. ලන්දේසීන් මෙරටින් පලවා හැරීමට රජු ඉංග්‍රීසීන්ගේ සහය පැතූහ.

| | |
|---|---|
| 1762 දී ජෝන් පයිබස් | - කීර්ති ශ්‍රී රාජසිංහ රජු හමුවිය. |
| 1782 දී හියු බොයිඩ් | - රාජාධි රාජසිංහ රජු හමුවිය. |
| 1795 දී රොබට් ඇන්ඩෲස් | - රාජාධිරාජසිංහ රජු හමුවිය. |

මුල් කාලයේ දී ලන්දේසීන් හා ඉංග්‍රීසීන් අතර මිත්‍ර සම්බන්ධතා තිබුණි. එම නිසා 1762 සහ 1782 දූතගමන්වලින් උඩරට රජුට ප්‍රයෝජනයක් නොවුණි.

1795 දී ඉංග්‍රීසීන් ලන්දේසි බලකොටු යටත් කිරීමට රජුගේ සහය ඉල්ලූහ. නමුත් රජුගේ සහය ලබා නොගෙනම ඉංග්‍රීසීන් ලන්දේසි බලකොටු යටත් කරගත්හ.

ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රංශය, ඕලන්දය ආක්‍රමණය කර, එහි බලය අල්ලා ගත්තේ ය. ඕලන්ද රජු වූ v වන විලියම් රජතුමා බ්‍රිතාන්‍යයට පලා ගියේ ය. ඕලන්දයේ ප්‍රංශ පාලනයක් ඇති විය. ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ප්‍රංශවරුන්ට අයත් වේ යැයි බ්‍රිතාන්‍යය බිය විය. බ්‍රිතාන්‍යයන්, ලන්දේසීන්ගේ ආරක්ෂාවට ලන්දේසි බලකොටුවලට ඉංග්‍රීසි හමුදාව ඇතුළත් කරගත යුතු යැයි විලියම් රජතුමාගෙන් ලිපියක් ලබා ගත්තේ ය. බ්‍රිතාන්‍යයේ කිව් මාළිගයේ දී ලියූ බැවින් එම ලිපිය කිව් ලිපිය නම් වේ.

එවකට ලංකාවේ ලන්දේසි ආණ්ඩුකාරවරයා වූ වන් එංගල්බෙක් වෙත ඉදිරිපත් කරනු ලැබූ විට ඔහු එයට එකඟ නොවීය.

ඉංග්‍රීසීහු යුද්ධ ප්‍රකාශ කළහ. 1795 අගෝස්තු 26 වන දින ත්‍රිකුණාමලයේ සිටි ලන්දේසීන්ගේ ෆෙඩ්රික් කොටුවට පහර දී අල්ලා ගත්හ. පිළිවෙලින් යාපනය, මන්නාරම, කල්පිටිය, කොළඹ බලකොටු යටත් කර ගත්හ.

1796 පෙබරවාරි වන විට ලංකාවේ ලන්දේසීන් සතු සියලු මුහුදුබඩ ප්‍රදේශ පෙරදිග ඉංග්‍රීසි වෙළෙඳ සමාගමට අයත් විය.

ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවලින් ලන්දේසීන් පලවා හැරීමට කළ යුද්ධයට සම්පූර්ණ වියදම දැරුවේ පෙරෙදිග ඉන්දීය වෙළෙඳ සමාගම ය. එම යුධ වියදම් පියවීමට ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවලින් වැඩි වශයෙන් බදු අයකර ගැනීමට ඉංග්‍රීසි වෙළෙඳ සමාගම පියවර ගත්හ. බදු අය කිරීමට මදුරාසියෙන් ගෙන්වූ අවුමිල්දාර් නම් නිලධාරීන් යෙදවිය. මේ නිසා 1797 දී මුහුදු බඩ ජනතාව ඉංග්‍රීසීන්ට විරුද්ධව විශාල කැරැල්ලක් කළහ. කැරැල්ල මර්ධනය කළ බ්‍රිතාන්‍යයෝ එය ඇතිවීමට හේතු සෙවීමට කර්නල් මියුරන් යටතේ “ද මියුරන් කොමිසම” නම් කොමිසමක් පත් කළේය.

එම කොමිසමේ නිර්දේශය වූයේ වෙළෙඳ කටයුතු හා පරිපාලන කටයුතු වෙන් වෙන් නිලධාරීන් යටතේ සිදු විය යුතු බව ය. 1798 - 1802 දක්වා මුහුදුබඩ ප්‍රදේශවල ආර්ථික කටයුතු ඉංග්‍රීසි වෙළෙඳ සමාගමත් දේශපාලන කටයුතු බ්‍රිතාන්‍ය ආණ්ඩුවත් මැදිහත් වීමෙන් සිදුවිය. පරිපාලනය සහ යුද්ධ කටයුතු සඳහා 1798 දී ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා පත් කරන ලදී. මෙම කාලයේ ද්විත්ව පාලනයක් පැවතුණි.

ආණ්ඩුකාරවරයාත්, වෙළෙඳ සමාගමත් අතර, සහයෝගය නැති වීම නිසා ද්විත්ව පාලනය දුර්වල විය.

එමනිසා 1802 දී වෙළෙඳ සමාගමට දී තිබූ බලය, ඉවත් කොට මුහුදුබඩ ප්‍රදේශ පාලනය සම්පූර්ණයෙන් බ්‍රිතාන්‍යය ආණ්ඩුව යටතට, එනම් කිරීටය හෙවත් රජු යටතට පවරා ගන්නා ලදී.

1800 දී මැක්ඩොවල් සෙනෙවියා යටතේ උඩරටට හමුදාවක් යවා ඉංග්‍රීසීන්ට වාසිදායක කොන්දේසිවලට ශ්‍රී වික්‍රම රාජසිංහ රජු එකඟ කරවා ගැනීමට නොහැකි විය.

1802 දී ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරායා, මැක්ඩොවල්ගේ නායකත්වයෙන් හමුදා කණ්ඩායම් 02 ක් කොළඹ සිට හා ත්‍රිකුණාමලයේ සිට උඩරටට යැවීය. මෙම හමුදාව 1803 පෙබරවාරි මහනුවරට ඇතුළ් විය.

මහනුවර අල්ලා ගෙන තම රැකවරණේ සිටි මුත්තුසාමි කුමරා උඩරට රජු ලෙස ප්‍රකාශ කළහ. මේ වන විට ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සැඟ වී සිටියේ ය.

වර්ෂා කාලය එනතුරු සටන පමා කළ උඩරැටියෝ වර්ෂාව එළඹෙත්ම මහනුවර සහ කොළඹ අතර, සබඳතා තැබූ මාර්ග සියල්ල අවහිර කර බ්‍රිතාන්‍යයන් මහනුවර කොටු කළහ. මුත්තුසාමි කුමරු ඇතුළු ඉංග්‍රීසි හමුදාව උඩරැටියන් විසින් සමූල ඝාතනය කරන ලදී.

1803 වර්ෂයෙන් පසු උඩරට රාජ්‍යයේ දේශපාලන තත්ත්වය ඉතා නරක අතට හැරුණි. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ පාලන කාලයේ දී උඩරට රාජධානිය තුළ බල අරගල උත්සන්න විය. රජු හා රදල ප්‍රධානීන් අතරත්, රජු හා භික්ෂූන් වහන්සේලා අතරත්, රදල ප්‍රධානීන් අතරත්, රජු හා සාමාන්‍ය ජනතාව අතරත් අර්බුද ඇති විය.

1815 වන විට උඩරට ඇති වූ මෙම ව්‍යාකූල තත්ත්වය තමාට වාසිවන බව බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා තේරුම් ගත්තේ ය.

ජෝන් ඩොයිලිගේ බුද්ධි තොරතුරු සහ ඉංග්‍රීසීන් වෙත පලා ඇවිත් සිටි ඇහැලේපොල අධිකාරම්ගේ උපදෙස් මත උඩරට ආක්‍රමණය සංවිධානය විය. රටවැසියන්ගේ ආරක්ෂාවට බ්‍රිතාන්‍ය හමුදාව උඩරටට ඇතුළු වන බව නිවේදනය කරන ලදි. කොළඹ, ගාල්ල, මීගමුව, ත්‍රිකුණාමලය, මඩකලපුව යන ප්‍රදේශවලින් පිටත් වූ සේනාංක 8 ක් මහනුවරට කිසිදු කරදරයකින් තොරව ආහ. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු, බිරින්දෑවරු දෙපළ සමඟ මැදමහනුවරට පළා ගියේ ය.

උඩරැටියන් පිරිසක් මැදමහනුවර බෝමුරේ සැඟව මිටි රජු සහ බිසෝවරු දෙදෙනා සොයා ගත්හ. ජෝන් ඩොයිලිගේ ආරක්ෂකත්වයට පත් වූ රජු හා පිරිස කොළඹට රැගෙන ගොස් 1816 දී ඉන්දියාවේ වෙල්ලෝරයට පිටුවහල් කරන ලදී. සිරගත වූ රජු උදරා බාධයක් සෑදී මිය ගියේ ය.

1815 මාර්තු 02 වන දින මඟුල් මඩුවේ දී බ්‍රිතාන්‍යයේ iii වන ජෝර්ජ් රජතුමා වෙනුවෙන් රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාත් උඩරට වෙනුවෙන් රදල ප්‍රධානීහු ද අත්සන් තැබූහ. එම ගිවිසුම උඩරට ගිවිසුමයි. උඩරට ගිවිසුම ප්‍රධාන වගන්ති 12 කින් සමන්විත ය.

1815 දී අහිමි වූ නිදහස යළි දිනා ගැනීමේ සටනක් ඇති කිරීමට 1818 දී උඩරැටියෝ ක්‍රියා කළහ.

1818 පළමු නිදහස් සටනයි. මෙයට ආසන්නතම හේතුව වූයේ, බහුතර සිංහල ජනයා සිටි වෙල්ලස්සේ, මඩිගේ මුහන්දිරම් ලෙස හජ්ජි මරික්කාර් නම් මුස්ලිම් ජාතිකයෙකු පත් කිරීමයි. මීට අමතරව,

- රජ කෙනෙකු නැතිවීම.
- බුදු දහම විනාශ වේ යැයි බිය.

- දේශීය සම්ප්‍රදායන් හා සිරිත් විරිත් නොසලකා බ්‍රිතාන්‍යයන් සිදු කළ පරිපාලන හා නීති ප්‍රතිසංස්කරණ නිසා ජන ජීවිතය වියවුල් වීම.
- රදල ප්‍රධානීන්ගේ බලතල, වරප්‍රසාද, ආදායම් මාර්ග පිරිහීම.

උඩරැටියන්ගේ රජු ලෙස පෙනී සිටි දොරේ සාමි නැමැත්තා වෙල්ලස්ස ප්‍රදේශයේ සිට ජනතාව සංවිධානය කළේ ය.

ඌව ඒජන්තවරයා, දොරේසාමි අල්ලා ගැනීමට හජ්ජි මරික්කාර් ඇතුළු පිරිසක් වෙල්ලස්සට යැවී ය. සටන්කාමීන් අතින් හජ්ජි මරික්කාල් මිය ගියේ ය. මීළඟට බදුල්ලේ උප ඒජන්තවරයා වූ විල්සන් හා ලෙෆ්ටිනන්ට් නිව්මන් වෙල්ලස්සට යවන ලදි. සටන්කාමීන් අතින් විල්සන් මිය ගියේ ය.

ඌව දිසාව භාර මොණරවිල කැප්පෙටිපොළ සටන මර්ධනයට යැවීය. කැප්පෙටිපොළ නිලමේ ඉංග්‍රීසීන්ගෙන් ලබාගත් ආයුධ භාර දී සටනට එකතු වී සටනට නායකත්වය ද දෙන ලදි.

වෙල්ලස්ස සටන, හේවාහැට, හාරිස්පත්තුව, මාතලේ, නුවර කලාවිය, හත්කෝරළය, සබරගමුව දක්වා ව්‍යාප්ත විය.

පළමු නිදහස් සටනේ නායකයන්

මොණරවිල කැප්පෙටිපොළ
මඩුගල්ලේ දිසාව
කිවුලේගෙදර මොහොට්ටාළ
පිළිමතලව්වේ දෙවන අධිකාරම්
බූටෑවේ රාටේ රාළ
කොහු කුඹුරේ රාළ

කැප්පෙටිපොළ නිලමේ ඌව වෙල්ලස්සට ද, මඩුගල්ලේ සහ උඩගබඩා නිලමේ දුම්බර හා තුම්පනේට ද, පිළිමතලව්වේ හත්කෝරළයට ද නායකත්වය දුනි. උඩරැටියන්ගේ ගරිල්ලා සටන් ක්‍රම නිසා බ්‍රිතාන්‍යන්ට බරපතල හානි සිදුවිය. බ්‍රිතාන්‍යයෝ මාර්ෂල් ලෝ හෙවත් යුධ නීතිය පනවා බිම්පාළු ප්‍රතිපත්තියෙන් සාමාන්‍ය මිනිසුන්ගේ ගේ දොර, වගාවන්, ආහාර, දේපළ ගිනි තබා විනාශ කළහ.

- සටන අඩපණ කිරීමට යොදා ගත් මාර්ෂල් ලෝ ප්‍රතිපත්තිවලට මුහුණ දීමට සටන්කරුවන්ට නොහැකි වීම.
- සටන විධිමත් ව සංවිධානය වීම.
- සටන මෙහෙය වූ නායකයන් අතර වූ පෞද්ගලික අමනාපකම්
- ඉංග්‍රීසින්ගේ ආයුධ ශක්තිය
- රජු ලෙස පෙනී සිටි තැනැත්තා නියම දොරේ සාමි නොවන බව හෙළිවිය.

ආදී කරුණු නිසා 1818 පළමු නිදහස් සටන අසාර්ථක විය. සටන අසාර්ථක වූ පසු,

- සටන මෙහෙය වූ කැප්පෙටිපොළ සහ මඩුගල්ලේ වැනි නායකයින් යුධ අධිකරණයෙන් වැරදිකරුවන් කර හිසගසා දා මැරීම.
- ඇහැලේපොල ඇතුළු පිරිසක් මුරුසි දිවයිනට පිටුවහල් කිරීම.
- 1815 උඩරට ගිවිසුම වෙනුවට 1818 උඩරට ප්‍රකාශය මගින් බ්‍රිතාන්‍ය බලය තහවුරු කිරීම.
- උඩරට රදල ප්‍රධානීන්ගේ බලතල අහෝසි කිරීම යනාදිය සිදු කරන ලදී.

1848 දී පොදු ජනයා අතරින් හා නායකයින්ගෙන් දෙවන නිදහස් සටන ඇරඹිණ.

සටන ඇරඹීමට හේතු

- කොල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයට අනුව වතු වගාව ආරම්භ විය. 1840 ඉඩම් පනත මගින් නීත්‍යානුකූල අයිතීන් තහවුරු කළ නොහැකි ඉඩම් රාශියක් රජයට පවරා ගන්නා ලදී. සාමාන්‍ය ජනයාට ගොවිබිම්, ඉඩම් රාශියක් අහිමි විය.
- කෘෂිකාර්මාන්තය අඩපණ වී ගොවිබිම් පාළු වීම.
- ග්‍රාමීය වැව්, අමුණු, ඇළවේලි මත නඩත්තුව අඩපණ වීම. සුළු ආරවුල් විසඳූ ගම් සභාව අඩපණ වීම.
- රජය හා මහජනතාව අතර සමීපතාව දුරස් වීම.
- බ්‍රිතාන්‍ය පාලනය යටතේ බුදුදහම නොසලකා හැරීම, උඩරට සුරාසැල් විවෘත කිරීම, සාරධර්ම පිරිහීම.
- කෝපි වෙළෙඳාමෙන් රජයට ආදායම අඩුවීම නිසා ටොරින්ටන් සාමි ආණ්ඩුකාරවරයා නව බදු පැනවීම.

| | | |
|---|---|---|
| මුද්දර බද්ද | තුවක්කු බද්ද | වෙළෙඳ සැල් බද්ද |
| බලු බද්ද | කරත්ත බද්ද | ඔරුපාරු බද්ද |
| ඇඟ බද්ද | | |

මෙසේ ඇති වූ විරෝධය බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි සටනක් විය. සටනේ ප්‍රධාන මධ්‍යස්ථානය මාතලේය. 1848 ජුලි වන විට මාතලේ, කුරුණෑගල, නුවර කලාවිය, තමන්කඩුව, හාරිස්පත්තුව සටන් කරුවන් අතට පත් වී තිබුණි.

සටනට නායකත්වය දුන්නේ,

ගොංගාලේ ගොඩබණ්ඩා - පෑලියගොඩ ඩේවිඩ්
පුරන් අප්පු - ප්‍රැන්සිස්කෝ
ඩිංගිරාළ
කඩහපොළ හිමි

1848 ජුලි මස ගොංගාලේ ගොඩබණ්ඩා ශ්‍රී වික්‍රම සර්වසිද්ධි නමින් දඹුල්ලේ දී ඔටුනු පැළඳී ය. 1848 සටන උඩරට ප්‍රදේශ කිහිපයක පමණක් පැතිරිණ.

බ්‍රිතාන්‍යය හමුදාව උපක්‍රමශීලීව මුලදීම සටන් ව්‍යාප්තිය පාලනය කළහ. එමනිසා මාතලේ, කුරුණෑගල, මහනුවර වැනි ප්‍රදේශ කිහිපයක පමණක් සටන් පැවතිණ.

ටොරින්ටන් ආණ්ඩුකාරවරයා මාෂල් ලෝ හෙවත් යුධ නීතිය පනවා දින කීපයකින්ම සටන මර්ධනය කර, සටනේ නායකයින් අත්අඩංගුවට ගත් හ.

කඩහපොළ හිමි, පුරන්අප්පු, ඩිංගිරාළ යුධ අධිකරණයට ගෙන ගොස් වරදකරුවන් කර වෙඩි තබා ඝාතනය කරන ලදී. ගොංගාලේ ගොඩ බණ්ඩාට කසපාර දී රටින් පිටුවහල් කරන ලදී. මෙසේ ඉංග්‍රීසීන්ට විරුද්ධව ඇති වූ දෙවන නිදහස් අරගලය පරාජය විය.

සටන අවසානයේ ඊට හේතුව සෙවීමට බේලි මහතා යටතේ කමිටුවක් පත් කරන ලදී. ටොරින්ටන් ආණ්ඩුකාරවරයා හා යටත් විජිත භාර ලේකම් එමර්සන් ටෙනන්ට් තනතුරින් ඉවත් කොට එංගලන්තයට යවන ලදි. වෙළෙඳ සැල් බද්ද, බලු බද්ද ඉවත් කර මුද්දර බද්ද, තුවක්කු බද්ද, ඇග බද්ද සංශෝධනය කරන ලදි.

කෘෂිකර්මාන්තය හා වාරිමාර්ග දියුණු කිරීමට රජය මැදිහත් විය. දළඳා වහන්සේගේ භාරකාරත්වය නැවත බ්‍රිතාන්‍ය ආණ්ඩුව යටතට පත්විය.

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් "**හේමමාලා උපහාර**" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN 978-624-208-925-6